Nestlé Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 26 August 2016

# නෙස්ලේ, 2014 සහ 2015 වර්ෂයන්හි 'අපනයනයෙහි නිරත වූ විශිෂ්ටතම බහුජාතික සමාගම' ලෙස ඇගයීමට පාත්‍ර වෙයි

නෙස්ලේ සමාගම තම ජයග්‍රාහී ගමන් මගෙහි තවත් වැදගත් ඉදිරි පියවරක් තැබීමට පසුගියදා සමත් විය. 2014 සහ 2015 වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවේ 'අපනයනයෙහි නිරත වූ විශිෂ්ටතම බහුජාතික සමාගම' වශයෙන් සම්මානයට පාත්‍ර වෙමින් ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී නෙස්ලේ සමාගම මෙම ජයග්‍රහණයට හිමිකම් කියන ලදි.

ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යාපාරික අංශය වෙනුවෙන් ලබා දුන් දායකත්වය අගයමින් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් අතින් මෙම සම්මානය පිරිනමන ලදි.

මෙම ජයග්‍රහණය පිළිබඳව අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ තම අදහස් දැක්වූවාය. ''ශ්‍රී ලාංකේය පිටිකළ පොල් කිරි අපනයනය කිරීමේදී අප පෙන්නුම් කළ සාර්ථකත්වය අගයමින් ලද මේ සම්මානය පිළිබඳව අපි ඉතාමත් ආඩම්බර වෙනවා. සැබෑ ශ්‍රී ලාංකික නිෂ්පාදනයක් ජාත්‍යන්තර වෙළෙඳපොළට රැගෙන යන බහුජාතික සමාගම් කිහිපය අතරින් එකක් වීමට හැකිවීම සහ ගෝලීය වශයෙන් පාරිභෝගිකයින් අතර ප්‍රියතම නිෂ්පාදනයක් බවට එය පත්කරන්නට හැකිවීම ගැන අපි ඉතාමත් සතුටට පත්වෙනවා. එපමණක් නොවෙයි අපගේ වටිනාකම් දාමය හරහා අපගේ සැපයුම්කරුවන්ගේ තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නංවමින් සහ ගොවීන්ට ප්‍රතිලාභ ලැබෙන භෝග වගාව සඳහා ගොවීන් සවිබලගන්වමින් අපි ජන ජීවිත ඉහළ නංවන්නට කටයුතු කරනවා.''

නෙස්ලේ ලංකා සමාගමේ පිටි කළ පොල් කිරි යනු ශ්‍රී ලංකාවේ පොල් ආශ්‍රිත නිෂ්පාදන අංශයෙහි අගය එකතු කළ විශාලතම නිෂ්පාදන අතරින් එකකි. ශ්‍රී ලංකාවේ පොල් සැපයුම්කරුවන් සමග දැනුම සහ තාක්ෂණික විශේෂඥභාවය බෙදාගනිමින් සහ 5,000කට අධික පොල් වගාකරන පවුල් සංඛ්‍යාවක ජීවනෝපාය තිරසාර කිරීමට ලබා දෙන දායකත්වය සම්බන්ධයෙන් අපනයන සංවර්ධන මණ්ඩලය සහ ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් පිරිනමන ලද සම්මාන රාශියකින් නෙස්ලේ ලංකා සමාගම පිදුම් ලබා තිබේ.

උසස් තත්ත්වයේ නැවුම් පොල් යොදාගනිමින් නෙස්ලේ ලංකා සමාගමේ කුරුණෑගල කර්මාන්තශාලාවෙහි පමණක් නිපදවන නෙස්ලේ මැගී පිටි කළ පොල් කිරි, සෘජුවම ලෝකයේ රටවල් 60කට වැඩි සංඛ්‍යාවක වෙළෙඳපොලවල්හි නෙස්ලේ සහ වෙනත් සමාගම් වෙත අපනයනය කරනු ලබයි.

නැවුම් පොල් මිලදී ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේදී නෙස්ලේ සමාගම රුපියල් බිලියන 2.6 ක දායකත්වයක් දේශීය පොල් කර්මාන්තයට ලබාදී තිබේ.

''ජනාධිපති අපනයන සම්මාන උළෙල ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට ලැබෙන ඉහළම ඇගයීම් අවස්ථාවක්. නෙස්ලේ සමාගම් ජාලයේ එකම පිටි කළ පොල් කිරි නිෂ්පාදකයා ලෙස අපගේ ස්ථාවර කාර්යසාධනය සහ වසරින් වසර ලබා දී තිබෙන දායකත්වය සඳහා ලැබූ පිළිගැනීම ගැන ආඩම්බර වෙනවා.'' යනුවෙන් මේ පිළිබඳව අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ අපනයන කළමනාකාරිණී - ලක්ෂිකා වීරමුණ්ඩ පැවසුවාය.

ජනාධිපති අපනයන සම්මාන උළෙල යනු දේශීය අපනයන ක්ෂේත්‍රයට ලබා දුන් දායකත්වය වෙනුවෙන් ජනාධිපතිවරයා අතින් ඇගයීමට ලක්වෙන සහ සම්මාන පිරිනැමෙන සෑම වර්ෂයකම පැවැත්වෙන අතිශය ඉහළ වැදගත්කමක් සහිත පූර්වාපේක්ෂිත සම්මාන ප්‍රදානෝත්සවයකි. මෙම සම්මාන උළෙලේදී නෙස්ලේ සමාගම මීට පෙර දිනාගත් සම්මාන අතර '2010 සහ 2013 වර්ෂයන්හිදී පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන අංශයේ විශිෂ්ටතම අපනයනකරු' සහ '2011 වර්ෂයේ ආහාර සහ වෙනත් රසවත් පානීය නිපැයුම් අංශයේ විශිෂ්ටතම අපනයනකරු' යන සම්මානයන්හි ප්‍රධාන තැනක් හිමිකර ගෙන ඇත.